# බලන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| **ස්ථානය** | : | බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව |
| **දිනය** | : | 2012.09.27 |
| **වේලාව** | : | ප.ව. 2.00 |

බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | ඩබ්. ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 3. | ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 4. | ගරු නාගරික මන්ත්‍රී | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 5. | ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. | ගරු නාගරික මන්ත්‍රී | ඒ. අසංක නිල්මිණි විජේසිංහ මැතිතුමා |
| 7. | ගරු නාගරික මනත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 8. | ගරු නාගරික මනත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

* ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා හට මෙදින රැස්වීමට සහභාගී වීමට නොහැකි බව දුරකථනයෙන් දැනුම් දෙන ලදී.

**නිලධාරී සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | ලේකම් | එම්. එච්. සීලවතී මිය |

## 01 ආගම සිහි කිරීම:

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී

## 02. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

ගරු සභාපතිතුම සභාව අමතමින් මෙම පවත්වන්නට යෙදෙන්නේ 2012 වර්ෂයේ සැප්තැම්බර් මාසයට අදාල මහා සභා රැස්වීම බව දන්වන ලද අතර මෙම සභා වාරයට පැමිණි ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ පුවත්පත් කලාවේදී මහතුන් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගන්නා බව ප්‍රකාශ කරන ලදී.

## 03. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු නාගරික මන්ත්‍රී. ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී. ඒ අනුව පසුගිය මහා සභා වාර්තාව සභා සම්මත විය.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදු නොවීය

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 ඩී 02 කඩ කාමරය

ඩී 02 කඩකාමරය සම්බන්ධයෙන් එම්. එන්. එම්. හසන් මහතා විසින් යොමු කරන ලද ලිපිය සභාවට ඉදිරිපත් කරන ලද අතර, එම කඩකාමරය සඳහා මාසික කුළිය පමණක් අය කිරීමට තීරණය කරන ලදී.

### 06:02 ඩී 16 කඩ කාමරය

ඩී 16 කඩ කාමරය සම්බන්ධයෙන් ආදායම් පරීක්ෂක විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලද අතර, එම කඩකාමරයේ කැඩී ඇති දොර සකස් කර වෙනත් කෙනෙකු හට කුළියට ලබා දීමට තීරණය විය.

### 06:03 බස්නැවතුම්පොල සී 13, සී 14 හා සී 15 කඩකාමර

බස්නැවතුම්පොල සී 13, සී 14 හා සී 15 කඩකාමර සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලද අතර, අදාල අයකර ගැනීම් සිදු කිරීම සඳහා නඩු පැවරීමට තීරණය කරන ලදී.

### 06:04 2013 වර්ෂය සඳහා කඩකුලී සංශෝධනය කිරීම

බස් නැවතුම්පොල ඒ, බී. සී. ඩී, කඩකාමර සඳහා 2013 වර්ෂයේ කඩකුලී සංශෝධනය කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලද අතර, අදාල කඩකුලී සංශෝධනය කිරීමට තීරණය කරන ලදී.

### 06:05 අංක 15 එළුමස් කඩය/අංක 16 ගව මස් කඩය/අංක 17 කුකුල් මස් කඩය

අංක 15 එළුමස් කඩය, අංක 16 ගව මස් කඩය සම්බන්ධයෙන් ඩී. එම්. පලීල් මහතා සහ අංක 17 කුකුල් මස් කඩය සම්බන්ධයෙන් එම්. ජේ. එම්. ඉම්රාන් මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපි සභා ගත කරන ලද අතර, මාසික කුළිය ලබා ගැනීමටත්, වර්ෂය අවසාන වූ පසු තැන්පත් මුදල් හිලව් කිරීමටත් තීරණය විය.

### 60:06 ජංගම සේවා දිනයක් පැවැත්වීම

ජංගම සේවා දිනයක් පැවැත්වීම සම්බන්ධව ආදායම් පරීක්ෂක විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදුව 2012 ඔක්තෝබර් මස 12 හා දෙසැම්බර් මස 07 යන දිනයන්හි ජංගම සේවාවන් පැවැත්වීමට අනුමැතිය ලබා දෙන ලදී.

### 06:07 බස්නැවතුම්පොල ඉහල මාලයේ වැසිකිළිය

බස්නැවතුම්පොල වැසිකිළි සම්බන්ධව ආදායම් පරීක්ෂක විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලද අතර, අදාල වැසිකිළි ඉවත් කර ඒවා කඩ කාමර වශයෙන් සකස් කිරීමට සභාව තීරණය කරන ලදී.

**06:08 වරිපනම් බදු අඩු කර ගැනීම**

බළන්ගොඩ, රත්නපුර පාර, අංක 148 දරන ගොඩනැගිල්ලේ උඩු මහල අංක 148 1/1 දරන කඩ කාමරය වසර කිහිපයක සිට වසා ඇති බැවින් එය වරිපනම් බද්දෙන් නිදහස් කරන මෙන් ඒ. එම්. දරුක් මහතා විසින් ඉල්ලා තිබූ ලිපිය සභා ගත කරන ලද අතර, එම කඩ කාමරය වසා දමා ඇති බැවින් වරිපනම් වලින් 50%ක් අඩු කිරීමට සභාව තීරණය කරන ලදී.

**06:09 රථවාහන ගාස්තු අය කිරීම ටෙන්ඩර් කිරීම**

2013 වර්ෂය සඳහා බළන්ගොඩ නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීම 2013 වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට 2013 දෙසැම්බර් 31 වන දින දක්වා කාලයට බදු දීම සඳහා සුදුසු බදුකරුවන් තෝරා ගැනීමට විවෘත ටෙන්ඩර් කැඳවීම සම්බන්ධයෙන් වැඩසටහන් සහකාර (මිශ්‍ර ආදායම්) විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලද අතර, රථවාහන ගාස්තු අය කිරීම සඳහා ටෙන්ඩර් කිරීමට සභාවේ අනුමැතිය ලැබුණි.

**06:10 2013 වර්ෂය සඳහා මස් කඩ කාමර ටෙන්ඩර් කිරීම**

චක්‍රලේඛ අංක 2009/01 හි උපදෙස් අනුව පොදු වෙළඳසැල 15, 16 හා 17 දරන මස් කඩ 2013 වර්ෂයේ ජනවාරි 01 වන දින සිට 2013 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කාලයට බදු දීමට සුදුසු බදුකරුවන් තෝරා ගැනීම සඳහා විවෘත ටෙන්ඩර් කැඳවීමට අනුමැතිය ලබා ගැනීම සඳහා වැඩසටහන් සහකාර (මිශ්‍ර ආදායම්) විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී. පසුගිය වර්ෂයේ අදාල කඩකාමරයන් සඳහා පිළිගනු ලැබූ මිල ගණන් වලට වඩා 10%ක් මෙවර අවම ලංසුව දීමේ දී එකතු කළ යුතු බවට ද එම ලිපියෙන් දන්වා තිබුණි. අදාල කඩකාමරයන් ටෙන්ඩර් කිරීමට මහා සභාව තීරණය කරන ලදී.

**06:11 පෞද්ගලික බස් රථ හිමියන් සමඟ සාකච්ඡාව**

2012.09.15 වන දින බළන්ගොඩ බස් රථ සේවා සංගමය සමඟ පැවති සාකච්ඡාවේ දී ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අතර එම වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී. එම ඉල්ලීම් පහත පරිදි වේ.

- බස් රථ ගාල් කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉඩම පවරාගැනීම
- පෞද්ගලික බස් රථ හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථ ඒකාබද්ධව සේවාවක් ලෙස පවත්වාගෙන යාම.
- මාර්ග කිහිපයක් සඳහා මෙතෙක් සකස් කර නොමැති බස් නැවතුම්පොල බස් රථ නැවතුම් ස්ථාන සකස් කිරීම.
- බස්නැවතුම්පොල භූමියේ බස්රථ හැර නතර කරනු ලබන අනෙකුත් වාහන වලින් ගාස්තු අය කිරීම
- පෞද්ගලික බස් රථ සඳහා දොරවෙල පාලම අසලින් බස් නැවතුම්පොලට තවත් පිවිසුම් මාර්ගයක් සකස් කිරීම.
- බස් නැවතුම්පොලට ත්‍රීරෝද රථ ඇතුල් කිරීම තහනම් කිරීම.
- බදුල්ල කොළඹ බස් රථ කොළඹ දෙසට ගමන් කිරීමේ දී නව අතුරු මාර්ගය දෙසට පමණක් ධාවනය කිරීම.

**06:12 ආදායම් සහායක සඳහා ඉන්ධන දීමනා ගෙවීම**

බළන්ගොඩ නගර සභාවේ ආදායම් සහායක වශයෙන් කටයුතු කරන එම්. උපුල් නිශාන්ත කුමාර මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපියක් සභා ගත කරන ලදී. මසකට

පෙට්‍රල් ලීටර 10ක් ලබා දීමට තීරණය වූ අතර, ආදායම් එකතු කිරීමේ ප්‍රගතිය ද සතුටුදායක මට්ටමේ පැවතිය යුතු බවට දන්වන ලදී.

**06:13 සැප්තැම්බර් මස 05 වන දින අතිගරු ජනාධිපතිතුමන් හමුවේ සිදුකරන ඉදිරිපත් කිරීම**

සැප්තැම්බර් මස 05 වන දින දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට පැමිණෙන අතිගරු ජනාධිපතිතුමන් වෙත සිදු කරන ඉදිරිපත් කිරීම සභාගත කරන ලදී. මෙහි දී පසුගිය දස වසර තුළ බළන්ගොඩ නගර සභාවෙන් සිදු කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් සහ ඉදිරියේ දී සිදු කිරීමට බලාපොරොත්තුවන සංවර්ධන කාර්යයන් ද, සිදුකරගෙන යාමේ දී අසාර්ථක තත්වයට පත්ව ඇති ව්‍යාපෘතීන්ද දක්වා ඇත.

**06:19 සර්ප වෙදකම සඳහා සුදුසු ස්ථානයක් ලබා දීම**

සර්ප වෙදකම සඳහා සුදුසු ස්ථානයක් ලබා ගැනීම සඳහා ඩබ්. ඩබ්. පී. විජේරිය මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභා ගත කරන ලද අතර, මේ සඳහා සුදුසු ස්ථානයක් සොයා බලා ලබා දීමට තීරණය විය

**06:20 මහජන පුස්තකාලය සඳහා පරිගණක යන්ත්‍රයක් ලබා ගැනීම**

මහජන පුස්තකාලය සඳහා පරිගණක යන්ත්‍රයක් ලබා ගැනීම සඳහා පුස්තකාලයාධිපති විසින් ඉදිරිපත් කර තිබූ ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී. පරිගණකයක් මිල දී ගැනීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**06.21 ජාතික කියවීමේ මාසය**

පුස්තකාලයාධිපති විසින් ඉදිරිපත් කර තිබූ ජාතික කියවීම් මාසයට අදාල වැඩසටහන සභාගත කරන ලද අතර, මුදල් තත්ත්වය සලකා බලා සභා අරමුදලින් රු. 50,000.00ක් වැය කිරීමට මහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**06:22 ආපදා කළමනාකරණය පිළිබඳ අමාත්‍ය සමුළුව - ඉන්දුනීසියාව**

2012 ඔක්තෝබර් මස 22 වන දින සිට 25 වන දින දක්වා ඉන්දුනීසියාවේ යොග්‍යකර්තා නගරයේ දී පැවැත්වීමට නියමිත එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආපදා අවම කිරීම පිළිබඳ අමාත්‍ය සමුළුව සඳහා බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා හට සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්. ඒ. නිමල් ප්‍රේමතිලක මහතා හට සහභාගී වීමට ආරාධනා කර තිබූ ලිපියක් සභා ගත කරන ලදී.

**06:23 නගර සභා බලප්‍රදේශයට අදාලව තක්සේරු ලේඛන ගතව ඇති පදිංචිකරුවන්ට නගර සභා බලප්‍රදේශයට ඡන්ද හිමිකම් ලබා ගැනීම**

බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ කොට්ටාස අංක 09 - හපුතලේ පාර අංක 469 සිට 469/20 දක්වා ද, රබර්වත්ත පාර අංක 19 සිට 19/36 දක්වා ද, වැලිහරණාව පාරේ දේපල කිහිපයක් ද නගර සභා බල ප්‍රදේශයට අදාල ලෙස තක්සේරු කර ඇතත් එම දේපල හිමියන් නගර සභා බල ප්‍රදේශයේ ඡන්දදායකයන් ලෙස ලේඛනගතර කර නොමැති වීම සම්බන්ධව දීර්ඝ වශයෙන් සභාව විසින් සාකච්ඡා කර ග්‍රාම නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම් හා සහකාර මැතිවරණ කොමසාරිස් ද මේ සම්බන්ධව දැනුවත් කර මෙම පුද්ගලයන්ගේ ඡන්ද හිමිකම් නගර සභා බල ප්‍රදේශයට අදාල වන සේ ලේඛනගත කිරිම සඳහා කටයුතු කිරීමට සභාව තීරණය කරන ලදී.

## 07. රු. 10,000.00ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

රු. 10,000.00ට වැඩි ගෙවීම් මුදල් ප්‍රතිපත්ති හා ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කර ඇති බව දන්වන ලදී.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

මෙවට මහා සභාවට ඇස්තමේන්තු ඉදිරිපත් නොවීය

## 08. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

### 08:01 මුදල් ප්‍රතිපත්ති හා ප්‍රසම්පාදන කමිටු වාර්තාව

2012.09.18 වන දින පැවති මුදල් ප්‍රතිපත්ති හා ප්‍රසම්පාදන කමිටු වාර්තාව සභාවේ අනුමත කරන ලදී.

### 08:02 මහජන පුස්තකාල උපදේශක කමිටුව

2012.09.18 වන දින පවත්වන ලද මහජන පුස්තකාල උපදේශන කමිටුවේ වාර්තාව සභාවේ අනුමත කරන ලදී.

### 08:03 කර්මාන්ත හා සංවර්ධන කමිටුව

2012.09.11 වන දින පැවති කර්මාන්ත හා සංවර්ධන කමිටු වාර්තාව සභාවේ අනුමත කරන ලදී.

## 09 යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

නැත

## 10. යෝජනා

### 10:01 ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා

1. නගර සභා සීමාව තුළ වෙනත් ආයතන වලින් කරන සංවර්ධන කටයුතු සිදු කිරීමට පෙර මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම.

2. බස් නැවතුම්පොල තීන්ත ආලේප කිරීම.

3. බස් නැවතුම්පොල ඇති අනවශ්‍ය වැසිකිළි ඉවත් කිරීම.

4. බස් නැවතුම්පොල සහ ඉරිදා පොල භූමිය තුළ ඇති අනවසර ත්‍රී රෝද රථ ගාල් ඉවත් කිරීම.

5. අනවසර එළවලු වෙළඳාම් ඉවත් කිරීම

6. පදික වේදිකාවේ වෙළඳාම් කරන අයට ස්ථිර ව්‍යාපාරික ස්ථාන ලබා දීම.

7. වෙළඳසැල් හිමියන්ට අයත් වෙළඳසැල් ඉදිරිපිට පදික වේදිකාවේ සිදු කරන අනවසර වෙළඳාම් නතර කිරීම.

8. සතිපොලේ ඉතිරිව ඇති කඩ කාමර සඳහා ආරක්ෂක ගේට්ටු සවි කිරීම.

9. මහජන බැංකුව අසළ බස්නැවතුම්පොල සම්බන්ධව පුද්ගලික අංශයේ හා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ නිලධාරීන් කැඳවා සාකච්ඡා කර තීරණයක් ගැනීම.

10. පොදු වෙළඳසැල පිටුපස ඇති තාවකාලික කඩ කාමර ඉවත් කිරීම සම්බන්ධව සාකච්ඡා කර තීරණයක් ගැනීම.

ඉහත යෝජනාවන් ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**10:02 ගරු උප සභාපති ඩබ්. ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා:**

1. පුවක්ගහමුල්ල පොදු ලිඳේ වැඩකටයුතු සඳහා සිමෙන්ති ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී. ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

2. පල්ලෙවෙල ප්‍රදේශයේ ඩෙංගුරෝග කාරකයන් ඇති වීමේ අවදානමක් සහිත බවට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් දන්වා ඇති කාණුව ප්‍රජාවගේ දායකත්වයෙන් නිසිව සකස් කිරීම සඳහා වැලි කියුබ් 01, සිමෙන්ති මිටි 06ක් ලබා දීමට යෝජනා කරන ලද අතර එය සභාවේ අනුමත විය.

ඉහත යෝජනාවන් ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**10:03 ගරු නාගරික මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා:**

1. අබලන් තත්වයට පත්ව ඇති කිරිඳිගල - අරංගලවත්ත පාර සංවර්ධනය කිරීම සඳහා සභාවට පවරා ගන්නා ලෙස ඉල්ලන ලදී.

මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

## 11. ආදායම් වියදම් හා වෙනත් වාර්තා ඉදිරිපත් කිරීම

**11:01 වාහන සඳහා ඉන්ධන වියදම**

2012.08.01 සිට 2012.08.30 වන දින දක්වා වාහන සඳහා වන ඉන්ධන වියදම සභාගත කරන ලද අතර එය අනුමත විය.

**11:02 2012 අගෝස්තු ලැබීම් විග්‍රහය**

- 2012 අගෝස්තු මාසය සඳහා වන ලැබීම් විග්‍රහය සභාවේ අනුමත **විය.**

| | |
|---|---:|
| පුනරාවර්තන ලැබීම් | 6,170,993.88 |
| වෙනත් ලැබීම් | 1,441,430.62 |
| **මුළු ලැබීම්** | **7,612,424.50** |
| පුනරාවර්තන වියදම් | 4,697,937.75 |
| වෙනත් වියදම් | 741,410.49 |
| මුළු වියදම් | **5,439,348.24** |

- බළන්ගොඩ තානායමේ 2012.08.01 සිට 2012.08.31 වන දින දක්වා වෙළඳ හා ලාභ අලාභ ගිණුම සභාවට ඉදිරිපත් කරන ලද අතර එය සභාවේ අනුමත විය.

## 12. වෙනත් කරුණු:

**12:01 ගරු නාගරික මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා:**

ගරු නාගරික මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා සභාව අමතමින්, දොරවෙල ප්‍රදේශයේ පානීය ජල ලිඳ ඉදිකිරීම සඳහා රු. 125,000.00ක් ප්‍රතිපාදන වශයෙන් ලැබුණු

අතර, එම මුදල ප්‍රමාණවත් නොවන නිසා තමන්ගේ පෞද්ගලික මුදලින් ද රු. 400,000.00ක පමණ මුදලක් යොදවා අදාල කටයුතු සිදුකරගෙන යන බව ද දැන්වීය.

**12:02 ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමා:**

ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමා සභාව අමතමින්, පසුගිය පළාත් සභා මැතිවරණයේ දී ජාතිබේද වලින් තොරව ජනතාව රජයට සහ මහින්ද චින්තන ප්‍රතිපත්ති මාලාවට සහයෝගය පළ කළ බව ද, මෙය රජයේ සංවර්ධන ක්‍රියාවලියට ශක්තියක් බව ද, ඉතිරි පළාත් සභා මැතිවරණයන් ද රජයට ජයග්‍රහණය කළ හැකි බව ද ප්‍රකාශ කළේය. තව දුරටත් සභාව අමතමින් මෙවර බළන්ගොඩ ආසනයේ වාර්තාගත 60%ක ඡන්ද ප්‍රතිශතයක් රජයට ලබා ගැනීමට හැකි වූ බව ද, අකිල එල්ලාවල මැතිතුමාගේ දේශපාලන ප්‍රවේශය බළන්ගොඩ ප්‍රදේශයට නව බලාපොරොත්තුවක් ඇති කරවන බව ද ප්‍රකාශ කළේය. පසුගිය කාලය මුළුල්ලේ අතිගරු ජනාධිපතිතුමන්ගේ දේශපාලන නායකත්වය යටතේ බළන්ගොඩ නව බස් නැවතුම්පොල ඇතුළු විශේෂ සංවර්ධන කාර්යයන් රැසක් සිදු වූ බව ද ප්‍රකාශ කළේය.

එමෙන්ම, බෝම්බුව ප්‍රදේශයේ ඉදිකරන ලද ආකාරයේ 'සේවා පියස' මධ්‍යස්ථානයන් අනෙක් වසම් වල ද ඉදිකළ හැකි නම් වැදගත් බව ද තව දුරටත් ප්‍රකාශ කළේය.

**12:03 ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා සභාව අමතමින්, ජනාධිපතිතුමන්ගේ වැඩපිළිවෙලට එරෙහිව ඇති දේශීය හා විදේශීය බලවේගයන්ට හොඳ පිළිතුරක් ලබා දෙමින් මෙවර පැවති පළාත් සභා 03 මැතිවරණයෙන් රජය ජයග්‍රහණය කළ බව පැවසීය. කොටි ත්‍රස්තවාදය පරාජය කරමින් ජනතාවට ලබා දුන් නිදහසට කෘතගුණ සැලකීමක් වශයෙන් අතිගරු ජනාධිපතිතුමන්ගේ ජයග්‍රහණය තහවුරු වූ බව ද, අතිවිශාල මුදල් ප්‍රමාණයක් රටේ සංවර්ධන කටයුතු සඳහා රජයෙන් යොදවා ඇති බව ද, ගම නැගුම හා මග නැගුම වැඩසටහන් යටතේ බළන්ගොඩ ප්‍රදේශයේ ජනතාවට ද විශාල සේවාවක් සිදු කිරීමට එමගින් හැකියාව ලැබුණු බව ද ප්‍රකාශ කළේය. මෙවර මැතිවරණයෙන් අකිල එල්ලාවල මැතිතුමන් බළන්ගොඩ ආසනය විශාල ඡන්ද ප්‍රමාණයකින් ජයග්‍රහණය කිරීමෙන් එතුමන්ගේ පියා සිදු කරගෙන ගිය වැඩපිළිවෙල ඉදිරියට කරගෙන යාමට හැකියාව ලැබෙන බව ද තව දුරටත් ප්‍රකාශ කරන ලදී.

**12:04 ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙර මැතිතුමා සභාව අමතමින්, අපගේ රටේ කලුසල්ලි, මත්ද්‍රව්‍ය හා මත්පැන් උවදුරක්ව ඇති බව දැක්වූ අතර, 70%ක් පමණ දුගී දුප්පත් ජනතාව මෙසේ මත්ද්‍රව්‍ය හා මත්පැන් වලට යොමු වීම ඛේදවාචකයක් බව සඳහන් කළේය. එමෙන්ම, බළන්ගොඩ නගරයේ වර්ග කිලෝමීටර කිහිපයක් ඇතුලත ප්‍රදේශයේ සුරාසැල් 10ක් ඇති බව ද, තවත් සුරාසැල් විවෘත කිරීමේ උත්සාහයක් ඇති බැවින් ඒ සම්බන්ධයෙන් දැඩි මහජන විරෝධතාවයක් ඇති බව ද ප්‍රකාශ කළේය.

**12:05 ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික්ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික්ෂා මැතිතුමා සභාව අමතමින්, බලගහමුල මංසන්ධියේ පදික වේදිකාවේ තිබූ අනතුරුදායක තත්වය හේතුවෙන් ආරක්ෂක වැටක අවශ්‍යතාවයක් තිබූ බව ද, මේ වන විට එම ස්ථානයේ ආරක්ෂක වැටක් ඉදිකර තිබීම ගැන සතුට ප්‍රකාශ කරන බව ද සඳහන් කළේය. වර්ෂාපතනය අවම තත්ත්වයක් යටතේ බළන්ගොඩ බොහෝ ප්‍රදේශ වලට ජල සැපයුම් ලබා දීමට නගර සභාව ක්‍රියාකිරීම ගැන ස්තුතිය පල කරන අතර, දෙහිගස්තලාව පාර ජනතාවට ද එසේ ජලය ලබා දෙන ලෙස

වැඩිදුරටත් ඉල්ලා සිටියේය. එමෙන්ම, පසුගිය මැතිවරණයේ ඡන්ද ප්‍රතිඵල සැලකීමේ දී බළන්ගොඩ ආසනයේ ඡන්ද දායකයන් 50%ක් පමණ ඡන්දය ප්‍රකාශ නොකළ බව ද, අනෙකුත් පළාත් සභාවන්හි ද එම තත්වය ඇති බව ද, මහමැතිවරණයක දි එම තත්ත්වය වෙනස් වන බව ද ප්‍රකාශ කළේය.

**12:06 ගරු උප සභාපති ඩබ්. ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා**

ගරු උප සභාපති ඩබ්. ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා සභාව අමතමින්, පසුගිය පළාත් සභා මැතිවරණයේ දී විවිධ අපහසුතා මධ්‍යයේ වුව ජනතාව දුන් තීන්දුව පැසසුමට ලක් කරන බව ප්‍රකාශ කළේය. බළන්ගොඩ ආසන සංවිධායක වශයෙන් සහ සෞඛ්‍ය අමාත්‍යවරයා වශයෙන් සිටි භාණු මුණිප්‍රිය මැතිතුමා විසින් රැකියා අවස්ථාවන් 700ක් පමණ ප්‍රදේශයට ලබා දුන් බව ද සඳහන් කළේය.

එමෙන්ම තුඹගොඩ නන්දන හෝටලය අසල බස් නතර කිරීම නැවැත්වීමෙන් ඔවුන්ගේ ආදායම් මාර්ගයන් අවහිරවීමෙන් බොහෝ අපහසුතාවයන්ට පත්ව ඇති බව ද, පදික වෙළඳුන් ඉවත් කිරීමෙන් ද එම වෙළඳුන්ගේ ජීවනෝපායයන් ඇණ හිටීම සම්බන්ධව තම විරුද්ධත්වය ප්‍රකාශ කරන බව ද වැඩි දුරටත් සඳහන් කළේය.

**12:07 ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා සභාව අමතමින් තමන් විසින් ගනු ලබන සියලුම තීරණයන් නගර සභා ආඥාපනතට අනුකූලව නගරයේ සංවර්ධනය සහ නිසි පැවැත්ම අරමුණු කර සිදු කරන බව දැන්වීය. මෙම නීති රීති උල්ලංඝනය කරන පුද්ගලයන්ගේ ක්‍රියාකාරකම් හේතුවෙන් ගංවතුර තර්ජන ඇතුළු නොයෙකුත් ව්‍යසනයන් සිදුවන බව ද, රථවාහන නීති උල්ලංඝනය හේතුවෙන් නන්දන හෝටලය අසල දී දරුවකුගේ ජීවිතයකට පවා හානියක් සිදු වූ බව ද මෙවන් හානි නැවත සිදුවීම වැලැක්වීම සඳහා අදාල නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයන් අනුගමනය කරන ලද බව ද පැහැදිලි කළේය. පදික වේදිකාවන් මගී ජනතාව සතු අතර ඒවායේ වෙළඳාම් නැවැත්වීමෙන් නගරයේ අලංකාරය ආරක්ෂා කිරීම සහ ජනතාවට පහසුව සැලසීම සිදු වූ බව ද වැඩිදුරටත් දක්වන ලදී.

## 13. අවසානය

**ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

අද දින සභා වාරයේ වැඩකටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය ලබා දුන් ගරු උපසභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරුන්ට සිය ස්තුතිය පල කරමින් මහා සභාවේ කටයුතු ප.ව. 5.00ට අවසන් කරන ලදී.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.